**පන්විල ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය**

**--------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිග්‍රහණ ලේඛනය අනුව, රු.1,347,975 ක් වූ පුස්තකාල පොත්වල අගය රු.1,178,098 ක් ලෙස ගිණුම්වල දක්වා තිබීම හේතුවෙන්, රු.169,877 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සභාව මගින් ඍජුවම ඉටු කළයුතු වැඩ සඳහා ලබා දී තිබූ මුදලින් වර්ෂය තුළ වැය නොකළ රු.2,642,216 ක මුදලක් ණයහිමියන් ලෙස දක්වා තිබුණි.

1.3.2 ලැබියයුතු ගිණුම්.

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.17,480,045 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.2,330,128 ක් වී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය.

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.390,146 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,157,352 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.767,206 ක අඩුවීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.10,834,201 ක් සභාව මගින් ගෙවීම් කර ඇතත්, මධ්‍යම පළාත් සභාව වෙතින් ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.9,608,068 ක් පමණි. මේ අනුව, හිඟ වැටුප් ප්‍රතිපූර්ණය රු.1,226,133 ක් සභාවේ පුනරාවර්තන ආදායමින් වැය කර තිබුණි.

(ආ) දේපළ ණය පොළී වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී, ගෙවීම් කර තිබූ මුදල රු.77,872 ක් වුව ද, පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.58,884 ක් පමණි. ඒ සඳහා වූ රු.18,988 ක හිඟ මුදල අතිරික්තයට එරෙහිව කපා හැර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය.

------------------------

2.3.1 වරිපනම් බදු

--------------

2014 දෙසැම්බර් 31 දිනට රු.529,490 ක ශේෂයක් පැවති අතර, එම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.290,103 ත් තවදුරටත් අය වියයුතුව තිබුණි. එම හිඟය සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.2 බදු කුළී.

------------

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.137,842 ක හිඟ ශේෂයක් වූ අතර, ඉන් වර්ෂය තුළ අය කර ගෙන තිබුණේ රු.79,984 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 58 කි. වර්ෂය අවසාන හිඟය රු.159,533 ක් වී තිබුණි. එම හිඟයෙන් 2015 ජූනි 30 දිනට රු.122,087 ක ශේෂයක් තවදුරටත් හිඟව පැවතුණි.

(ආ) සභාව සතු කඩ කාමර බදුකරුවන් විසින් අතුරු බදුකරුවන් වෙත පවරා දී තිබූ අවස්ථාවන් වූ අතර ඒ පිළිබඳව ගිවිසුම ප්‍රකාරව කටයුතු කර, නැවත පවරා ගැනීමට කටයුතු නොකර, එම කඩ කාමර වල අයිතිය අතුරු බදුකරුවන් වෙත පවරා දීමටත්, එම අතුරු බදුකරුවන්ගෙන් රු.580,000 ක තැන්පත් මුදලක් ලබා ගැනීමටත් කටයුතු කර තිබුණි.

2.3.3 පරිසර බලපත්‍ර ගාස්තු

-------------------------

2000 අංක 53 දරන හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවා තිබූ රෙගුලාසිවලට අනුකූලව අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ නියමයන් අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්ත 22 ක් අවිධිමත් ලෙස පවත්වා තිබුණි. 2014 වර්ෂයේ දී ඉන් සභාවට අහිමිව තිබූ ආදායම රු.80,000 ක් විය.

2.3.4 ව්‍යාපාර බලපත්‍ර ගාස්තු

------------------------

සභා බල ප්‍රදේශය තුළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි මඩොල්කැලේ හෝටලයකින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.672,832 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් (සියයට 01 ක) අය වියයුතුව තිබුණු අතර, ඉන් 2015 ජූනි 30 දිනට රු.336,416 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

2.3.5 අක්කර බදු.

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිගය රු.33,646 ක් වූ අතර, වර්ෂය තුළ බිල් කිරීම රු.39,808 ක් විය. එම ආදායම් අය කර ගැනීම පිළිවෙළින් රු.6,491 ක් හා රු.15,987 ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 19 ක් හා සියයට 40 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.50,976 ක හිග ශේෂයක් පැවතිණි. එම හිග මුදලින් 2015 ජූනි 30 දිනට රු.35,198 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.233,470 ක් ලැබියයුතුව පැවතුණි. එම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.22,520 ක ශේෂයක් තවදුරටත් ලැබියයුතුව පැවතිණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන්, 2014 දෙසැම්බර් 31 දින වන විට හිගව තිබූ මුදල රු.357,127 ක් විය. එම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.277,127 ක ශේෂයක් තවදුරටත් ගෙවියයුතුව තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 05 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) සම්ප්‍රේෂණ කුළුණු මගින් සන්නිවේදන පහසුකම් සපයා තිබූ සමාගම්වලින් වාර්ෂිකව ව්‍යාපාර බදු අය කර ගතයුතු වුව ද, සමාගම් 07 කින් අවම වශයෙන් රු.30,000 ක මුදලක් අය කර නොතිබුණි.

(ඈ) අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 48 න් තනතුරු 08 ක පුරප්පාඩු පැවතුණ ද, එය සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 සිට 2014 අතරතුර දී සභාව වෙත ලැබී තිබූ රු.15,140,000 ක් වූ වාහන 04 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර ද නොතිබුණි.

(ආ) 2014 හා ඊට පෙර වර්ෂයන් හීදි ස්ථාන මාරු වී ගිය සේවකයින් හා නිලධාරීන් 12 දෙනෙකුගෙන් අය වියයුතුව තිබූ රු.317,634 ක් වූ ණය ශේෂයන් ස්ථාන මාරු වී ගිය ආයතනයන්ගෙන් ගෙන්වා ගැනීමට කටයුතු නොකර, වාරික වශයෙන් අය කර ගනිමින් පැවතින.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුවෙන් සභාවට අය විය යුතුව තිබූ පරිපාලන වියදම රු.15,000 ක් 2015 මාර්තු 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 20 දිනැති අංක 1842 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය ප්‍රකාර සමාලෝචිත වර්ෂයේ බිල් කර තිබූ රු.81,027 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු අය කර ගත නොහැකි වී තිබුණ ද, එම දැන්වීම් පුවරු ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.50,677 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදි ස්ථාන මාරු වී ගිය නිලධාරින් දෙදෙනෙකුගේ ඇප තැන්පත් රු.20,617 ක් වර්ෂය අවසන තෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ බාහිර ප්‍රතිපාදන අපේක්ෂාවෙන් ඉටු කරන ලද කර්මාන්ත 40 කට අදාළ රු.3,277,039 ක මුදලක් 2015 අප්‍රේල් 30 දින වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(උ) ජල ව්‍යාපෘතිය මගින් ජලය ලබා දී තිබූ ස්ථාන 406 ක් සභා බල ප්‍රදේශය තුල හඳුනා ගැණුනු අතර ජල පාරිභෝගිකයින් සඳහා ජල මනු සවි කර විධිමත් ආකාරයකින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සේවය අත්හිට වු හා ස්ථාන මාරු වු නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.16,237 ක ණය ශේෂයක් විගණිත දින වු 2015 මාර්තු 30 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

-------------------------------------------

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,075,000 ක වටිනා වත්කම් 05 ක් නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතින.

(ආ) පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2014 දෙසැම්බර් 06 දින රු.110,712 ක් වටිනා ගැල්වනයිස් බට (GI) 100 ක් ලබා දි තිබුණ ද, ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමකින් තොරව ගබඩා කර තිබුණි.

3.4 හඳුනාගත් අලාභ.

------------------

2014 දෙසැම්බර් 31 දිනට රු.10,268 ක් වටිනා පුස්තකාල පොත් 60 ක ඌනතාවයක් පවත්නා බව අනාවරණය විය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය.

-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉටු කළ කර්මාන්තවල අඩුපාඩු හේතුවෙන්, බාහිර අමාත්‍යාංශවලින් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබූ කර්මාන්තවලට අදාළව රු.2,610,914 ක් ණයහිමි ශේෂයක් 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ආ) පශු සම්පත් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබූ කර්මාන්ත දෙකකට අදාල වූ මුදලින් ඉදි කිරීම්වල අඩුපාඩු හේතුවෙන්, රු.1,765,254 ක් ඉහත අමාත්‍යාංශය විසින් සභාවෙන් නැවත ඉල්ලා තිබුණි. මෙම සාවද්‍ය ගෙවීම් අදාල වගකිවයුත්තන්ගෙන් අයකර නිරවුල් කිරිමට හෝ ගිණුම් වලින් හෙළිදරව් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාවුස්සාවත්ත පහළ කොටස මාර්ග සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තු වැඩ විෂයය අංක 02 යටතේ මාර්ග තලය මතුපිට පස් දමා මට්ටම් කර, තලා ඒ මත කොන්ක්‍රීට් යෙදියයුතු වුවත්, එසේ කටයුතු කිරීමකින් තොරව බිම කොන්ක්‍රීට් කර තිබිය දි, ඒ සඳහා රු.79,936 ක් කාර්මික නිලධාරින් විසින් සාවද්‍ය ලෙස ගෙවිම සහතික කර තිබුණි.

(ඈ) කර්මාන්තය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

---

ගෝමරය වත්ත ක්‍රීඩාගාරය ඉදි කිරීම.

(i) ප්‍රමාද දින 202 ක් සඳහා රු.99,470 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි.

(ii) පරීක්ෂණ දිනය වන විට වැඩ විෂයය අංක 01 සිට 06 දක්වා විෂයයන්ට අයත් කොන්ක්‍රීට් කුළුණු (column) හා පළමු කොන්ක්‍රීට් ඇතුරුම (slab) මට්ටම දක්වා ඉදි කර තිබුණ ද, ඒවා නිසි පරිදි ස්ථානගත කර නොතිබු බවත්, වා කුහර (huney comb) පැවතී අතර, ඒවා බදාම මගින් වසා තිබුණි. එසේ තිබිය දී රු.490,000 ක් කළ වැඩ සහතික කර තිබුණි.

(ඉ) බාහිර ආයතනයන්ගෙන් සභාව වෙත ලබා දී තිබු අරමුදල් වැය කිරීමේ දී, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය ප්‍රකාර ප්‍රජාපාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පිරිනැමීමේ දී, කිසියම් නිශ්චිත කාලයක් තුළ සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව 03 කට නොවැඩි වියයුතු සේම එකතු වටිනාකම රුපියල් මිලියන 02 නොඉක්මවියයුතු වුවත්, එම විධිවිධානයට පටහැනිව රු.13,380,000 ක් වු කර්මාන්ත 34 ක් සමිති 09 ක් වෙත පිරිනමා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

---

4.1 සංයුක්ත සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදන සැළැස්ම.

---

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි රු.56,902,077 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය.

---

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ අභ්‍යන්තර විගණන සැළසුමක් සකසා තිබුණ ද, ප්‍රමාණාත්මක විගණනයක් පවත්වා නොතිබුණි.

4.4 අයවැය පාලනය.

---

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු සමග තථ්‍ය ආදායම් හා වියදම් සැසදීමේ දි , ආදායම් විෂයයන් 06 ක සියයට 13 සිට සියයට 69 දක්වා ද වියදම් විෂයයන් 08 ක සියයට 13 සිට සියයට 100 ඉක්මවා විචලනයන් පැවතුණි. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ සභාව මගින් පිළියෙළ කර තිබු අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ  අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය